තිරුක්කොවිල් ප්‍රාදේශීය සභාව
අම්පාර දිස්ත්‍රික්කය
---------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි 13 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ඔක්තෝබර් 29 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට තිරුක්කොවිල් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම
-----------------------------------------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 2 අනුව ප්‍රභාරව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිනි අංක 03 අනුව මූල්‍ය ප්‍රකාශන සකස්කිරීම සඳහා අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ගෙවියයුතු විගණන ගාස්තු රු. 8,500 ක් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පුස්තකාලයට සභාව විසින් මිලදී ගන්නා ලද සහ සභාවට පරිත්‍යාග වශයෙන් ලැබුණු පොත්වල වටිනාකම් රු. 169,043 ක් වුවද, ගිණුම්වල රු. 54,764 ක් වශයෙන් පෙන්වා තිබීම නිසා වත්කම්වල වටිනාකම් රු. 114,297 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ඒෂියන් ෆවුන්ඩේෂන් ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී සභාව වෙත පරිත්‍යාග කර තිබූ පොත් විස්සක වටිනාකම් තක්සේරුකර වත්කම් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ඈ) කොම්පෝස්ට් පොහොර තොග ලේඛනය අනුව, කොම්පොස්ට් පොහොර බෑග් 3,795 ක් රු. 721,000 ක මුදලකට විකුණුබව සඳහන් වුවද මූල්‍ය ප්‍රකාශනවලට කොම්පොස්ට් පොහොර විකුණුම් ආදායම් වශයෙන් රු. 162,000 ක් පමණක් පෙන්වා තිබුණි. ඒ අනුව කොම්පෝස්ට් පොහොර විකුණුම ආදායම් රු. 559,000 කින් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ රු. 151,190 ක කොම්පොස්ට් පොහොර ණය පදනම් මත විකුණවූ තිබුණද එය ණය ගැති ගිණුමට ගෙනවිත් නොතිබුණි.

1.3.4 ලැබියයුතු ගිණුම්

(අ) 2011 වර්ෂට පෙර ලබාදීතිබූ අත්තිකාරම් මුදල රු. 270,941 ක් හඳුනාගෙන අයකර ගැනීමට හෝ අදාල අයට එරෙහිව නීතියානුකූලව කටයුතු කිරීමට 2015 සැප්තැම්බර් 02 වන දින දක්වා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 මාර්තු 19 දින ඝණ අපද්‍රව්‍ය කළමණාකරන වැඩසටහන සඳහා සභාපති විසින් අත්තිකාරම් වශයෙන් ලබාගත් රු. 20,000 ක් 2015 සැප්තැම්බර් 02 වන දින දක්වා ආපසු ගෙවා නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් සුළු වියදම් සඳහා ලබාගත් රු. 5,000 ක අත්තිකාරම් මුදල 2015 සැප්තැම්බර් 02 දිනය දක්වා නිරවුල් කර නොතිබුණි.

1.3.5 විගණන සඳහා සාක්ෂි නොවීම

පහත ගිණුම් විෂයයන් ඉදිරියෙන් පෙන්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| විෂයන් | වටිනාකම් | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ඉඩම් හා ගොඩනැගිලි | 126,013,965 | ස්ථාවර වත්කම් ලේඛන |
| ලීබඩු සහ සවි කිරීම් | 1,468,600 | |
| මෝටර් වාහන හා කරත්ත | 55,224 | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 2,425,198 | |

1.3.6 නීති, රීති සහ රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂනය විය.

| නීති, රීති යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 වර්ෂයේ ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන ) රීති | |
| පරිච්ඡේදය IV වගන්තිය 180 | මුදල්, ගබඩා ද්‍රව්‍ය සහ චෙක්පත්වලට අත්සන් තැබීම යනාදී කටයුතු නිලධාරින් දෙදෙනෙකුට පරිපාලනමය වශයෙන් භාරදී තිබුනද ඔවුන්ගෙන් ආරක්ෂක ඇප ලබා ගෙන නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 1647 | වාහනවල අංක, වර්ගය, ලැබුනු දිනය, ඉන්ධන වර්ගය යන විස්තර ඇතුලත් වාහන ලොග් පොත් පවත්වා නොතිබුණි. |
| (ආ) IAI/2002/02 හා 2002 නොවැම්බර් 28 දින භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිඝණක 09 ක් සහ පරිඝණක උපකරණ මෘදුකාංග සටහන් කිරීම සඳහා පරිඝණක ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) 2014 දෙසැම්බර් 26 දින අංක 08/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය | සමාලෝචිත වර්ෂයදී වාහන 16 ක් වෙනුවෙන් රක්ෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 711,495 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් රු. 1,532,256 ක් වූවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු. 820,761 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 වරිපනම් බදු
-------------

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134 වන වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තිබෙන ඉඩම් හා ඉදිකරන ලද නිවාස, ගොඩනැගිලි විලින් 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා වරිපනම් බදු ගණනය කර අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

2.2.2 වෙනත් ආදායම්
------------------

(අ) 2011 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදයට අදාලව අයවියයුතු දෛනික පොල බදු හිඟ රු. 141,000 ක්ද සති අන්ත පොළ බදු හිඟ රු. 94,870 ක්ද වෙනත් හිඟ බදුකුලි රු. 517,660 ක්ද වෙළඳ සංකීර්ණයේ හිඟ කඩ බදු රු. 915,515 ක් වශයෙන් එකතුව රු. 1,669,045 ක හිඟ ආදායම් අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ සන්නිවේදන ආයතනවලින් ස්ථාපිත කර තිබූ සන්නිවේදන කුළුණු 07 ක සඳහා බලපත්‍ර ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවීමට ක්‍රියා නොකිරීම නිසා වාර්ෂික සභාවට රු. 140,000 ක් පමණ ආදායමක් අහිමිවී තිබුණි.

(ඇ) 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 126 වන වගන්තිය අනුව සභාවේ ආදායම් අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවීමට ක්‍රියා නොකිරීම නිසා සභා බල ප්‍රදේශයේ පුද්ගලික ආයතනවලින් වෙළඳ භාණ්ඩ ප්‍රචාරය කිරීම සඳහා ඉදිකර තිබූ දැන්වීම් පුවරු 14 ක් සඳහා බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට නොහැකිව තිබුණි. මේ හේතුවෙන් වාර්ෂිකව රු. 60,000 ක් පමණ ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

2.2.3 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු
-----------------------------------

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ලැබියයුතු උසාවි දඩ රු. 2,865,230 ක මුදල පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගෙන් ලබා ගැනීමට 2015 සැප්තැම්බර් 02 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු මුද්දර ගාස්තු රු. 1,490,233 ක් රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් අයකර ගැනීමට 2015 සැප්තැම්බර් 02 දින දක්වා කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කළමණාකරණ දුර්වලතා
---------------------------

(අ) සභාවේ සේවය කරන නිලධාරින් දෙදෙනෙකුට 2013 වර්ෂයේදී පොදු තැන්පත් ගිණුමෙන් ලබාදී තිබූ වැටුප් අත්තිකාරම් රු. 42,347 ක් 2015 සැප්තැම්බර් 02 දිනය දක්වා අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2001/15 අංක දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව නිලධාරීන් 25 දෙනෙකු සේවය කරන කාර්යාලවල ඇඟිලි සලකුණු යොදනා යන්ත්‍ර භාවිතා කළයුතුබව සඳහා වූවද නිලධාරීන් 59 සේවය කරන ප්‍රාදේශීය සභාවේ ඇඟිලි සලකුණ තැබීමේ යන්ත්‍ර භාවිතා කර නොතිබුණි.

(ඇ) 2012 නොවැම්බර් සිට 2013 පෙබරවාරි දක්වාවූ සඳහා පරිච්ඡේදය සඳහා සෙවක භාරකාර අරමුදල් සභාවට ගෙවියයුතු රු. 16,933 ක් අදාල කාල පරිච්ඡේදයේදී ගෙවීම් අපොහසත්වීම නිසා සේවක භාරකාර අරමුදලට දඩ වශයෙන් රු. 6,846 ක් ගෙවා තිබුණි.

4 පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) ස්ථාවර වත්කම් පාලනය

(ඈ) අත්තිකාරම් අයකර ගැනීම